සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
ஆணடி - 2018
**First Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 6 | විෂයය / பாடம் / Subject } බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper } I,II | කාලය / காலம் / Time } පැය 02 |

නම : - ..........................................................................  විභාග අංකය : - .................................

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- 1 – 15 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

1) සිදුහත් බෝසතාණන් වහන්සේ මිනිස් ලොව ඉපදීමට පෙර උපත ලබා සිටියේ,
   1) තුසිත දෙව් ලොවෙහි ය.
   2) මනුෂ්‍ය ලොවෙහි ය.
   3) බ්‍රහ්ම ලොවෙහි ය.
   4) නාග ලොවෙහි ය.

2) බෝසතාණන් වහන්සේට මිනිස් ලොව ඉපදීමට ආරාධනා කළේ,
   1) සක් දෙවිඳු ය.
   2) සහම්පති බ්‍රහ්මයා ය.
   3) මහා බ්‍රහ්මයා ය.
   4) සටීකාර බ්‍රහ්මයා ය.

3) පංචමහා විලෝකනය පිළිවෙලින් සඳහන් වන පිළිතුර වන්නේ,
   1) කුලය, මව, දේශය, දීපය, කාලය
   2) දේශය, දීපය, කාලය, කුලය, මව
   3) දීපය, කාලය, දේශය, කුලය, මව
   4) කාලය, දීපය, දේශය, කුලය, මව

4) බෝසතාණන් වහන්සේ මව් කුස පිළිසිඳ ගනු ලැබුවේ,
   1) පොසොන් පොහෝ දිනක ය.
   2) දුරුතු පොහෝ දිනක ය.
   3) ඇසළ පොහෝ දිනක ය.
   4) වෙසක් පොහෝ දිනක ය.

5) බෝසත් කුමරුට නම් තැබීමේ උළෙල පවත්වනු ලැබුවේ කුමරු ඉපදී,
   1) හත්වන දිනයේ දී ය.
   2) දෙවන දිනයේ දී ය.
   3) සිව්වන දිනයේ දී ය.
   4) පස්වන දිනයේ දී ය.

6) සුද්ධෝදන රජුගේ ගුරුතුමා වන්නේ,
   1) ආලාර කාලාම තවුසා ය.
   2) අසිත තවුසා ය.
   3) උද්දකරාම තවුසා ය.
   4) සර්ව මිත්‍ර බමුණා ය.

7) සුද්ධෝදන රජතුමා දෙවන වර සිදුහත් කුමරට වන්දනා කළේ,
   1) වප් මඟුල් දිනයේ දී ය.
   2) නම් තැබූ දිනයේ දී ය.
   3) කුමරු උපන් දිනයේ දී ය.
   4) බුදු බව ලැබූ දිනයේ දී ය.

8) බෝසත් කුමරුට නම් තබන උළෙලට සහභාගි වූ බමුණන් සංඛ්‍යාව වන්නේ,
1) 105 කි. 2) 103 කි 3) 106 කි. 4) 108 කි.

9) බෝසතාණන් වහන්සේට සිවුරු පිරිකර පූජා කරනු ලැබුවේ,
1) සචිමිත්‍ර බමුණා ය. 3) සටිකාර බ්‍රහ්මයා ය.
2) කොණ්ඩඤ්ඤ බමුණා ය. 4) සොත්ථිය බමුණා ය.

10) බෝසතාණන් වහන්සේට කිරිපිඩු පූජා කරනු ලැබුවේ,
1) සුජාතා සිටු දේවිය. 3) සුමනා සිටු දේවිය.
2) විශාඛා සිටු දේවිය. 4) උප්පලවණ්ණා සිටු දේවිය.

11) සිදුහත් කුමරු ඒකාන්තයෙන් ම බුද්ධත්වයට පත්වන බව ප්‍රකාශ කළේ,
1) කොණ්ඩඤ්ඤ තවුසා ය. 3) ආලාර කාලාම තවුසා ය.
2) අසිත තවුසා ය. 4) භග්ගව තවුසා ය.

12) "ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ........" යන ගාථාවෙන් වන්දනා කරන්නේ,
1) බුදු ගුණය
2) දහම් ගුණය
3) සඟ ගුණය
4) තෙරුවන් ගුණය

13) රාහුල හිමියන් රහත් බවට පත්වූයේ,
1) දම්සක් පැවතුම් සූත්‍රය ඇසීමෙනි.
2) මහා මංගල සූත්‍රය ඇසීමෙනි.
3) චූල්ල රාහුලෝවාද සූත්‍රය ඇසීමෙනි.
4) අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය ඇසීමෙනි.

14) "මගේ අදහස ඉටුවූවා සේම ඔබේ අදහස ද ඉටුවේවා"යි ප්‍රාර්ථනා කළේ,
1) සුජාතා සිටු දේවියයි. 3) යශෝධරා දේවියයි.
2) විශාඛා සිටු දේවියයි. 4) කිසාගෝතමියයි.

15) සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වය ලබන විට උන් වහන්සේ වයස,
1) හතළිස් පහකි. 3) විසි නවයකි.
2) තිස් පහකි. 4) විසි පහකි.

- 16 20 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරා යා කරන්න.

| A | | B |
|---|---|---|
| 16) | ශාරීරික චෛත්‍ය වන්නේ | i) 'වන්දාමි චේතියන් සබ්බං' යන ගාථාව ය. |
| 17) | පාරිභෝගික චෛත්‍ය වන්නේ | ii) 'කායේන වාචා චිත්තේන' යන ගාථාව ය. |
| 18) | ත්‍රිවිධ චෛත්‍ය වඳින ගාථාව වන්නේ | iii) වෙහෙර වහන්සේ ය. |
| 19) | දෙවියන්ට පින්දෙන ගාථාව වන්නේ | iv) බෝධීන් වහන්සේ ය. |
| 20) | ත්‍රිවිධ රත්නය සමා කරන ගාථාව වන්නේ | v) 'එත්තාවතාච අම්හේහි' යන ගාථාව ය. |

**(ලකුණු 2 x 20 = 40)**

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20කි. අනෙක් ප්‍රශ්නවලට ලකුණු 10 බැගිනි.**

01) පළමු පාසල් වාරයේ දී ඔබ විසින් කරන ලද පාසල් පාදක ඇගයීමට අදාළව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) පන්සල් යාමට පෙර දින ගුරුතුමිය දුන් උපදෙස් දෙකක් ලියන්න.
2) පන්සලට රැගෙන ගිය පූජා ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
3) පූජා භූමියට ඇතුළුවීමට පෙර ඔබ විසින් අනුගමනය කළ පිළිවෙත් දෙකක් ලියන්න.
4) වන්දනා කිරීමට පෙර කරන ලද වතාවත් දෙකක් ලියන්න.
5) ජලය, මිදුල යන්නට භාවිත කෙරෙන ශාසනික වචන දෙක ලියන්න.
6) පසඟ පිහිටුවා වැඳීමේ දී පොළොවේ ස්පර්ශ වන ස්ථාන දෙකක් ලියන්න.
7) විහාරස්ථානයේ දී ඔබ පළමුව හා දෙවනුව වැඳුම් පිදුම් කළේ කුමන ස්ථානවලට ද?
8) මෙම ගමන තුළින් ඔබේ ජීවිතයට සම්බන්ධ කරගත් යහපත් ගුණ ධර්ම දෙකක් නම් කරන්න.
9) "සුගන්ධිකාය වදනං......." යන ගාථාවෙන් පූජා කරනු ලබන ද්‍රව්‍ය මොනවාද?
10) දහම් අධ්‍යාපනය සඳහා පාසලට අමතරව ඔබ යා යුතු සුදුසුම ස්ථානය කුමක්ද?

**(ලකුණු 2 x 10 = 20)**

02)
1) බුද්ධ කෝලාහලය ලෙස හඳුන්වන්නේ කුමක්ද? (ල. 2)
2) සිදුහත් කුමරුගේ ඉපදීමත් සමඟ සිදුවූ අසිරිමත් සිදුවීම් දෙකක් ලියන්න. (ල. 3)
3) සිදුහත් කුමරු ඉපදී දබර ඇඟිල්ල අහසට දිගු කර කළ සිංහ නාදය කුමක්ද? (ල. 5)

03)
1) "රාහුලෝ ජාතෝ - බන්ධන ජාතං" මෙහි තේරුම ලියන්න. (ල. 2)
2) සතර පෙර නිමිති වලින් තුනක් ලියා දක්වන්න. (ල. 3)
3) සිදුහත් බෝසතාණන් වහන්සේ මහාභිනිෂ්ක්‍රමණය කළ ආකාරය කෙටියෙන් ලියා දක්වන්න. (ල. 5)

04)
1) භාවනා කිරීමේ දී හිඳගන්න ඉරියව් දෙක නම් කරන්න. (ල. 2)
2) භාවනා කිරීමට පෙර කළ යුතු කාර්යයන් තුනක් (03) ලියන්න. (ල. 3)
3) මෙත් වැඩීමේ ආනිසංස පහක් (05) දක්වන්න. (ල. 5)

05)
1) නරසීහ ගාථා වලින් කියවෙන්නේ කවුරුන් ගැනද? (ල. 2)
2) රාහුල පොඩි හාමුදුරුවන්ට ලැබුණු අග තනතුර කුමක්ද? (ල. 3)
3) රාහුල හාමුදුරුවන්ගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ මොනවාද? (ල. 5)

06)
1) නමස්කාර පාඨය ලියා දක්වන්න. (ල. 2)
2) ගිහියාගේ නිත්‍ය ශීලයෙහි පළමු සිල්පද තුනෙහි තේරුම ලියන්න. (ල. 3)
3) පන්සිල් සුරැකීමෙන් සමාජයට සැලසෙන යහපත වාක්‍ය පහකින් ලියා දක්වන්න. (ල. 5)

07)
1) අසිත තවුසාට කියන තවත් නමක් ලියන්න. (ල. 2)
2) ත්‍රිවිද්‍යා නම් කරන්න. (ල. 3)
3) පස්වග තවුසන්ගේ නම් ලියා දක්වන්න. (ල. 5)